# වාර්ෂික වාර්තාව
# ஆண்டறிக்கை
# Annual Report
# 2016










## ශ්‍රම වාසනා අරමුදල
## சிரம வாசனா நிதியம்
## Shrama Vasana Fund

# පටුන ...

පිටුව


* මෙහෙවර හා දැක්ම 03
* ගරු කම්කරු අමාත්‍ය තුමාගේ සුභපැතුම් පණිවිඩය 04
* ගරු කම්කරු රාජ්‍ය අමාත්‍ය තුමාගේ සුභපැතුම් පණිවිඩය 05
* සභාපති තුමාගේ සුභපැතුම් පණිවිඩය 06
* සාමාන්‍යාධිකාරී තුමාගේ සුභපැතුම් පණිවිඩය 07
* ශ්‍රම වාසනා අරමුදලේ පාලන ව්‍යුහය 08
* 2016 වසර සඳහා සංවිධාන සටහන 09
* ශ්‍රම වාසනා අරමුදල හා එහි අරමුණු 10
* ශ්‍රම වාසනා අරමුදලේ වර්ධනය හා ලොතරැයි ආදායම 11
* ශ්‍රම වාසනා අරමුදලේ වැඩසටහන් සමාලෝචනය 12-20

ශ්‍රම වාසනා අරමුදලේ අවසාන ගිණුම් 2016

* ශේෂ පත්‍රය 22
* ආදායම් වියදම් ගිණුම 23
* ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය 24
* මුදල් ප්‍රවාහ ප්‍රකාශය 25
* ගිණුම් ප්‍රතිපත්ති ප්‍රකාශය 26
* ගිණුම් වලට අදාල සටහන් 27-30
* අයවැය සංසන්දනය 31
* ශේෂ පිරික්සුම 32-33
* 2016 විගණන විමසුම 34-42

# මෙහෙවර හා දැක්ම ...

## දැක්ම ( Vision )

"තෘප්තිමත් ශ්‍රම බලකායක්"

## මෙහෙවර ( Mission )

"ව්‍යසනයන්හිදී පිහිට වෙමින් සේවක සුභසාධනය ප්‍රවර්ධනය ඉහළ නංවමින් යහපත් වැඩ බිමක් නිර්මාණය කිරීම."



# ගරු කම්කරු අමාත්‍යතුමාගේ සුභ පැතුම්

1998 අංක 12 දරණ පනතින් ස්ථාපිත ශ්‍රම වාසනා අරමුදල කම්කරු අමාත්‍යාංශය යටතේ පවතින අතර එහි සභාපතීත්වය කම්කරු අමාත්‍යාංශයේ ලේකම් සතු වේ.

ශ්‍රම වාසනා අරමුදල විසින් පලකරනු ලබන වාර්ෂික වාර්තාවට කම්කරු අමාත්‍යවරයා ලෙස සුභපැතුම් පණිවිඩයක් ඉදිරිපත් කරන්නේ ඉතාමත් සතුටිනි.

රටක සංවර්ධනයට කාර්යක්ෂම හා ඵලදායී ශ්‍රම බලකායක් ඉවහල් වන අතර, මෙය සඵල කර ගැනීමට ඉතාමත් උනන්දුවෙන් හා කැපවීමෙන් ශ්‍රම වාසනා අරමුදල මඟින් දීප ව්‍යාප්තව සිදුකරනු ලබන වැඩසටහන් මා අගය කොට සලකමි.

සුවහසක් ශ්‍රමිකයන්ගේ අභිවෘද්ධිය උදෙසා ගන්නා වූ මේ ප්‍රයත්නයට උරදෙන අමාත්‍යාංශයේ ලේකම්තුමා, දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයට හා ශ්‍රම වාසනා අරමුදලේ කාර්ය මණ්ඩලයට මාගේ ස්තූතිය පුදකරන අතර, යහ පාලනයක් තුලින් රටේ වැඩ කරන කම්කරු ජනතාවට මහඟු සේවාවක් කිරීමට ශ්‍රම වාසනා අරමුදලට හැකි වේවායි මා ප්‍රාර්ථනා කරමි!

ස්තූතියි

**ඩබ්ලිව්. ඩී. ජේ. සෙනවිරත්න**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.



# කම්කරු රාජ්‍ය අමාත්‍යතුමාගේ සුභ පැතුම්

කම්කරු අමාත්‍යාංශය යටතේ පවතින ආයතනයක් වන ශ්‍රම වාසනා අරමුදල විසින් පල කරනු ලබන 2016 වාර්ෂික වාර්තාවට සුභපැතුම් එක කරන්නේ ඉතාම කැමැත්තෙමි.

කම්කරු අමාත්‍යාංශය හා ඒ යටතේ පවතින ආයතන විසින් රටේ ආර්ථිකයේ අභිවෘද්ධියට විශාල දායකත්වයක් හා මිලියන නවයකට ආසන්න වන සමස්ථ වැඩ කරන ජනතාව වෙනුවෙන් සිදු කරනු ලබන මෙහෙය සුවිශාල වේ.

ශ්‍රම වාසනා අරමුදල පුද්ගලික අංශයේ සේවක සේවිකාවන්ගේ සුභසාධනය උදෙසා ම පිහිටුවන ලද ආයතනයක් වන අතර එහි නිශ්චිත අරමුණු ඔස්සේ යමින් ශ්‍රමිකයන් පමණක් නොව ඔවුන්ගේ පවුල් සවිබල ගැන්වීමේ කාර්යයෙහි ද නියැලී කටයුතු කරනු ලබයි.

ශ්‍රම වාසනා අරමුදල විසින් දීප ව්‍යාප්තව වෛද්‍ය සායන පැවැත්වීම දැනුවත් කිරීමේ වැඩසටහන් හා වැඩපල ආරක්ෂණය ආදී අංශ වලින් විවිධ වැඩසටහන් සංවිධානය කරමින් අනතුරු හා අවදානම් කලින් හඳුනාගෙන ඒ සඳහා අවශ්‍ය පූර්ව සැලසුම් සකස් කිරීමත් වැදගත් වේ.

මෙම වැඩ කටයුතු සාර්ථක කර ගැනීමට අවශ්‍ය සහයෝගය ලබා දෙන කම්කරු අමාත්‍යාංශයේ, කම්කරු දෙපාර්තමේන්තුවේ සහ අනෙකුත් අනුබද්ධ ආයතනවල සියළුම කාර්ය මණ්ඩලයටත් ශ්‍රම වාසනා අරමුදලේ සාමාන්‍යාධිකාරිතුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත් මාගේ ස්තූතිය පුද කරමි.

රවීන්ද්‍ර සමරවීර
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා රාජ්‍ය අමාත්‍ය

# සභාපතිතුමාගේ සුභ පැතුම් පණිවිඩය .



ශ්‍රම වාසනා අරමුදල විසින් පල කරනු ලබන 2016 වාර්ෂික වාර්තාවට සුභපැතුම් පණිවිඩයක් නිකුත් කරනු ලබන්නේ ඉමහත් සතුටිනි.

1988 අංක 12 දරන ශ්‍රම වාසනා අරමුදල් පනත මගින් ස්ථාපිත ශ්‍රම වාසනා අරමුදල පෞද්ගලික අංශයේ සේවක සේවිකාවන්ගේ සුභ සාධනය උදෙසා සුවිසල් කාර්යභාරයක් ඉටු කරනු ලබයි. හදිසි අවස්ථා වලදි සේවකයින්ට උපකාර කිරීම, වෘත්තිය අනතුරු නිසා මරණයට හෝ පූර්ණ ආබාධිත තත්වයට පත්වන සේවක දරුදැරියන්ට ශිෂ්‍යාත්ව ලබා දිම. ආයතන වසා දැමීම හෝ හදිසියේ සේවයෙන් පහ කරන සේවක සේවිකාවන් වෙනුවෙන් නීති ආධාර ලබා දිම හා ඔවුන් වෘත්තිය පුහුණු පාඨමාලා සඳහා යොමු කර නව රැකියා සඳහා යොමු කිරීම ආදී විශේෂිත වු අරමුණු 6 ක් ඔස්සේ ශ්‍රම වාසනා අරමුදල සේවක සුභසාධනයට උපරිම දායකත්වයක් ලබාදේ.

මෙවැනි අරමුණු සාක්ෂාත් කරගැනිමට කටයුතු කරන කම්කරු අමාත්‍යාංශයේ ලේකම් තුමා ඇතුළු කාර්ය මණ්ඩලය, කම්කරු දෙපාර්තමේන්තුවේ කම්කරු කොමසාරිස්වරුන්, නියෝජ්‍යය කම්කරු කොමසාරිස්වරුන් සහ දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්ය ඇතුලු කාර්ය මණ්ඩලයට මාගේ කෘතඥතාවය පලකර සිටිමි.
එමෙන්ම ශ්‍රම වාසනා අරමුදලේ සියලුම කටයුතු කළමනාකරණය කරමින් එහි අභිවෘද්ධිය වෙනුවෙන් කටයුතු කරන සාමාන්‍යාධිකාරි තුමා ඇතුළු කාර්ය මණ්ඩලයට ද මගේ ස්තුතිය පුද කර සිටිමි.

එස්.එම්.ගෝඨාභය ජයරත්න
ලේකම් කම්කරු අමාත්‍යාංශය,
සභාපති/ශ්‍රම වාසනා අරමුදල



# සාමාන්‍යාධිකාරී තුමාගේ සුභ පැතුම් පණිවිඩය.

ශ්‍රී ලාංකික වැඩ කරන ජනතාවගේ සුභ සිද්ධිය පිණිස  ම ආරම්භ කරන ලද ශ්‍රම වාසනා අරමුදලේ 2016 වාර්ෂික වාර්ථාවට සුභ පැතුම් පණිවිඩයක් නිකුත් කරන්නේ ඉතා සතුටිනි.

ශ්‍රම වාසනා අරමුදල ජාතික ලොතරැයි මණ්ඩලය හා ඒකාබද්ධව පවත්වනු ලබන ජාතික සම්පත ලොතරැයිය තුලින් අරමුදල් රැස් කර ලංකාව පුරා විසිරී සිටින මිලියන 9 කට ආසන්න වූ වැඩ කරන ජනතාවට සුභ සාධනය සලසමින්,ඔවුන්ගේ පවුල් සවිබල ගැන්වීම මූලිකවම සිදු කරයි.

ක්‍රියාශීලී සහ නිරෝගිමත් ශ්‍රම බලකායක් බිහිකිරීමේ අරමුණින් දීප ව්‍යාප්ත කම්කරු කාර්යාල සහ දිස්ත්‍රික් කර්මාන්ත ශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාල හරහා නිරන්තර තොරතුරු සොයා බලමින් ශ්‍රමිකයින් හමුවට ගොස් ඔවුන්ගේ අවශ්‍යතා අනුව විවිධ වූ සේවාවන් සපයනු ලබයි.

මේ යටතේ වෛද්‍ය සායන, ශිෂ්‍යත්ව වැඩසටහන්, අක්ෂි වෛද්‍ය සායන, දැනුවත් කිරීමේ වැඩසටහන්, පුහුණු වැඩසටහන්, සහ සවිබල ගැන්වීමේ වැඩසටහන් සංවිධානය කරන අතර  ගරු කම්කරු අමාත්‍යතුමාගේ හා  ගරු රාජ්‍ය අමාත්‍ය තුමාගේ උපදෙස්, අමාත්‍යාංශ ලේකම්තුමාගේ මඟපෙන්වීම් සහ කම්කරු දෙපාර්තමේන්තුවේ සහ අනෙකුත් අනුබද්ධ ආයතන වලින් අපට ලැබෙන සහයෝගය මම කෘතවේදීව සිහිපත් කරමි.

තවද මෙම කටයුතු සාර්ථකව කරගෙන යාමට අවශ්‍ය සහයෝගයත් උනන්දුවත් නිතරම දක්වන මාගේ **කාර්ය** මණ්ඩලයට  ද මාගේ කෘතඥතාවය මෙහිදී ප්‍රකාශ කර සිටිමි.

ඩී.ආර්.ජයලත්.
සාමාන්‍යාධිකාරී,
ශ්‍රම වාසනා අරමුදල

# පාලන ව්‍යුහය.....


1998 අංක 12 දරණ ශ්‍රම වාසනා අරමුදල් පනතින් ස්ථාපිත ශ්‍රම වාසනා අරමුදල කම්කරු අමාත්‍යාංශය යටතේ පවතින අතර එහි සභාපතීත්වය කම්කරු අමාත්‍යාංශයේ ලේකම් සතු වේ.

ශ්‍රම වාසනා අරමුදල් පනතට අනුව අරමුදලේ පාලන කටයුතු පිළිබඳ සම්පූර්ණ වගකීම ශ්‍රම වාසනා අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇති අතර අරමුදල කළමනාකරණය හා ඊට අදාල කටයුතු සියල්ලම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇත.

## *2016* අධ්‍යක්ෂ මණ්ඩලය - ශ්‍රම වාසනා අරමුදල

| නම | තනතුර |
|---|---|
| එස්.එම්.ගෝඨාභය ජයරත්න | සභාපති |
| එම්.ඩී.සී.අමරතුංග | සාමාජික |
| එම්.ජේ.ආර්.පුවිරාජ් | සාමාජික |
| ඩබ්.පී.අමරසිංහ | සාමාජික |
| එස්.එන්.සූරියකුමාර | සාමාජික |
| එස්.බී.යූ.එස්.මෛත්‍රීපාල | සාමාජික |
| ඩී.ආර්.ජයලත් | සාමාන්‍යාධිකාරී/ශ්‍රම වාසනා අරමුදල |

## 2016-12-31 දිනට සංවිධාන සටහන



# ශ්‍රම වාසනා අරමුදල සහ එහි අරමුණු

## ශ්‍රම වාසනා අරමුදල

**1998** අංක **12** දරණ පනතින් ස්ථාපිත ශ්‍රම වාසනා අරමුදල කම්කරු හා කම්කරු අමාත්‍යාංශය යටතේ පවතින කම්කරු සුභ සාධනය උදෙසා ආරම්භ කරන ලද ආයතනයකි. ශ්‍රම වාසනා අරමුදල පනතේ අරමුණු **6** ඔස්සේ ආරම්භයේ සිට මේ දක්වා විවිධ සුභ සාධන වැඩසටහන් පවත්වා ශ්‍රී ලාංකීය සේවා නියුක්තිකයින්ගේ උන්නතියට කටයුතු සම්පාදනය කර ඇත.

ශ්‍රම වාසනා අරමුදල වෙත ප්‍රධාන ආදායම් මාර්ගය ලෙස ජාතික ලොතරැයි මණ්ඩලය විසින් ලබා දෙන දායකත්වය ජාතික සම්පත ලොතරැයි අලෙවියත් සමග ක්‍රම ක්‍රමයෙන් වැඩිවෙමින් පවතින අතර එම දායකත්වය වැඩිවීමත් සමග කම්කරු සුභ සාධනය උදෙසා සිදු කිරීමට නියමිත සේවාවන් ද මේ සමග වර්ධනය කර ගත හැක.

## ශ්‍රම වාසනා අරමුදලේ අරමුණු

(අ) සේවා නියුක්තයන්ගේ සුභ සාධනය ප්‍රවර්ධනය කිරීම.

(ආ) සේවා නියුක්තයන් සේවයෙහි යෙදී සිටි ආයතන පූර්ව දැනුම් දීමකින් තොරව වසා දැමූ අවස්ථාවක, ඒ සේවා නියුක්තයන්ට මූල්‍ය හා වෙනත් ආධාර සැපයීම.

(ඇ) හදිසි අවස්ථාවල දී සේවා නියුක්තයන්ට වෛද්‍ය හා වෙනත් පහසුකම් සැපයීම.

(ඈ) සේවා නියුක්තයන්ට විරුද්ධව පරීක්ෂණ ආරම්භ කරනු ලැබූ විටක දී ඔවුන්ට තාවකාලික ආධාර සැපයීම.

(ඉ) ව්‍යසන අවස්ථාවල දී සේවා නියුක්තයන්ට හෝ ඔවුන්ගෙන් යැපෙන්නන්ට මූල්‍යමය සහ වෙනත් ප්‍රතිලාභ සැපයීම.

(ඊ) සේවා නියුක්තයන්ගේ සුභ සාධනය සඳහා විශිෂ්ට සේවයක් කර ඇති තැනැත්තන්ට ත්‍යාග පිරිණැමීම.

## ශ්‍රම වාසනා අරමුදල සඳහා ලැබීම්

(අ) පාර්ලිමේන්තුව විසින් අරමුදලේ අරමුණු ඉටුකර ගැනීමේ කාර්ය සඳහා කලින් කල සම්මත කරනු ලැබිය හැකි සියලු මුදල්.

(ආ) දේශී හෝ විදේශීය ප්‍රභවයන්ගේන් ප්‍රධාන, ත්‍යාග හෝ පරිත්‍යාග වශයෙන් ලැබෙන සියලුම මුදල්

(ඇ) අරමුදල මගින් කරන ආයෝජනවලින් ආදායම වශයෙන් ලැබෙන මුදල්


(ඈ) 13 වන වගන්තියේ සඳහන් ලොතරැයි වලින් ලැබෙන මුදල් ද ඇතුලුව, මේ පනත යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේදී සහ කර්තව්‍ය ඉටු කිරීමේදී අරමුදල ලැබෙන සියලු මුදල් ශ්‍රම වාසනා අරමුදල

පෞද්ගලික අංශයේ සේවකයින් ආවරණය වන පරිදි පිහිටුවා ඇති අතර ස්වයං රැකියා කරනු ලබන පිරිස මෙමගින් ආවරණය නොවේ. ශ්‍රම වාසනා අරමුදලේ මූල්‍ය ධාරිතාව මත විවිධ

වැඩසටහන් එක් එක් සීමාවන් තුළ ක්‍රියාත්මක කරනු ලැබේ. මූල්‍ය ධාරිතාව වැඩිවීමත් සමග එම සීමා වලින් ඔබ්බට තව දුරටත් සේවාවන් පුළුල් කිරීම **2012** වර්ෂයේදී සිට සිදු කරන ලදි.

## ශ්‍රම වාසනා අරමුදලේ වර්ධනය


| | 2011 (මිලියන) | 2012 (මිලියන) | 2013 (මිලියන) | 2014 (මිලියන) | 2015 (මිලියන) | 2016 (මිලියන) |
|---|---|---|---|---|---|---|
| අරමුදලේවටිනාකම | 187 | 234 | 292 | 331 | 369 | 381 |
| අරමුදලේ වර්ධනය | 39 | 47 | 58 | 39 | 38 | 12 |




රූප සටහන් 2

## ලොතරැයි ආදායම්

| | 2011 (මිලියන) | 2012 (මිලියන) | 2013 (මිලියන) | 2014 (මිලියන) | 2015 (මිලියන) | 2016 (මිලියන) |
|---|---|---|---|---|---|---|
| ආදායම | 39 | 49 | 63 | 59 | 62 | 65 |
| ආදායම වර්ධනය | 11 | 10 | 14 | -4 | 3 | 3 |



## ශ්‍රම වාසනා අරමුදලේ වැඩසටහන් සමාලෝචනය

ශ්‍රී ලංකාව තුල වර්තමානයේ පවතින සාමකාමී වතාවරණයත් රටෙහි පවතින දේශපාලන ස්ථාවර භාවය හා පවතින යහපාලනය හේතු කොටගෙන ශ්‍රී ලංකාව ආයෝජනයන්ට යහපත් රටක් ලෙස ඇති පිළිගැනීමත් හේතුවෙන් කලින් පැවතියාට වඩා වැඩි විදේශීය ආයෝජනයන් වර්ධනය වෙමින් පවතී. මේ හේතු නිසා ශ්‍රී ලංකා ආර්ථිකයේ සීග්‍ර වර්ධනයක් පෙන්නුම් කෙරේ.

මෙම හේතු නිසා ශ්‍රී ලංකාව තුල නව **කර්මාන්ත** ශාලා ආරම්භ වීමත් පැවති **කර්මාන්ත** පුළුල් වීමත් හේතුවෙන් වර්තමානය වනවිට ලංකාවේ ක්‍රියාකාරී ශ්‍රම බලකාය මිලියන නවයකට ආසන්නව පවතී.

දිනෙන් දින වැඩිවන ශ්‍රම බලකාය ඉලක්ක කර ශ්‍රම වාසනා අරමුදල විසින් සිදු කරනු ලබන සේවාවන් ද වැඩි කර ඇත. ශ්‍රම වාසනා අරමුදල විසින් එහි අරමුණු හා ඊට අනුශාංගික අරමුණු ඔස්සේ ලාකීය ශ්‍රමික ප්‍රජාව වෙත කරනු ලබන සේවාවන් ද වැඩිකර ඇත.
2016 වසර තුල ලංකාවේ සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි විවිධ සවිබල ගැන්වීමේ වැඩසටහන්, සුභසාධක වැඩසටහන්, දැනුවත් කිරීමේ වැඩසටහන් රාශියක් සිදුකරන ලදී.

<u>අක්ෂි වෛද්‍ය සායනය-බත්තරමුල්ල-2016/01/31</u>





**ශ්‍රම වාසනා අරමුදලට මුදල් සපයන ජාතික සම්පත විශේෂ ලොතරැයියේ පළමු ටිකට්පත ජනාධිපතිතුමා වෙත පිළිගැන්වීම-2016/02/10**





**ශිෂ්‍යත්ව වැඩසටහන- ශ්‍රී ලංකා ආයෝජන ප්‍රවර්ධන කලාපය - කටුනායක-2016/04/28**






**සුභ සාධන ප්‍රවර්ධන වැඩසටහන-ශ්‍රී ලංකා ආයෝජන ප්‍රවර්ධන කලාපය - කටුනායක-2016/04/28**





දැනුවත් කිරීමේ වැඩසටහන-යාපනය-2016/05/12


හදිසි ගංවතුරෙන් විපතට පත්කම්කරු පවුල් වෙත වියලි ආහාර බෙදා දීම-අරණායක-2016/06/02





හදිසි ගංවතුරෙන් විපතට පත්කම්කරු පවුල් වෙත වියලි ආහාර බෙදා දීම-බුලත්කොහුපිටිය-2016/06/02





**<u>වෘත්තීය අනතුරු නිසා මියගිය/ආබාධිත සේවකයින් ගේ දරුවන් වෙත ශිෂ්‍යත්ව ලබාදීම. තිඹිරිගස්යාය-2016/06/23</u>**





**<u>කම්කරු පවුල් වල කාන්තාවන් සවිබල ගැන්වීමේ වැඩසටහන වැඩසටහන - තිඹිරිගස්යාය-2016/06/23</u>**





**<u>ශ්‍රමික ප්‍රජාව වෙත නොමිලේ ඇස්කණ්නාඩි බෙදා දීම -තන්තිරිමලය-2016/07/06</u>**





**<u>කාන්තාවන් සවිබල ගැන්වීමේ වැඩසටහන-පොලොන්නරුව-2016/07/30</u>**





**<u>ශ්‍රමික පවුල් වල දරුවන් ඉලක්ක කර පවත් වූ ශිෂ්‍යත්ව සම්මන්ත්‍රණ වැඩසටහන- හිඟුරක්ගොඩ රජරට මහා විද්‍යාලීය ශ්‍රවණාගාරය -2016/07/30</u>**





**<u>අඩු අදායම්ලාභී ශ්‍රමික පවුල්වල දූ දරුවන් වෙත පාසල් උපකරණ ලබා දීම-පොළොන්නරුව 2016/07/30</u>**





## අඩු අදායම්ලාභී දූ දරුවන් වෙත පාසල් උපකරණ බෙදා දීම - මතුගම--2016/08/09







## අඩු අදායම්ලාභී කම්කරු පවුල්වෙත වියළි ආහාර බෙදා දීම - මතුගම- 2016/08/09







## අඩු අදායම්ලාභී දූ දරුවන් වෙත පාසල් උපකරණ බෙදා දීම - ගෝමරන්කඩවල 2016/09/13








අඩු අදායම්ලාභී කම්කරු පවුල්වෙත වියළි ආහාර බෙදා දීම - ගෝමරන්කඩවල -2016/09/13







අඩු අදායම්ලාභී දූ දරුවන් වෙත පාසල් උපකරණ බෙදා දීම - මොරවැව-2016/09/13








අඩු අදායම්ලාභී කම්කරු පවුල්වෙත වියළි ආහාර බෙදා දීම - මොරවැව-2016/09/13







<u>**අඩු අදායම්ලාභී දූ දරුවන් වෙත පාසල් උපකරණ බෙදා දීම  දීම -  පදවිය -2016/09/14**</u>





<u>**ආයෝජන සැකසුම්  කලාපය -සීතාවක(අත්පන්දු පිටියක් ලබා දීම)- 2016/10/24**</u>





<u>**ආයෝජන සැකසුම්  කලාපය -බියගම (දන්ත සායන පුටුවක් ලබාදීම)--2016/11/17**</u>





**<u>දැනුවත් කිරීමේ වැඩසටහන-අකුරගොඩ ත්‍රිවිධ හමුදාවේ ඉදිකිරීම් අංශයේ-නොවැම්බර්-2016/11/21</u>**







**<u>අඩු අදායම්ලාභී ශ්‍රමික පවුල්වල දූ දරුවන් වෙත පාසල් උපකරණ ලබා දීම-රත්නපුර- නොවැම්බර්-2016/11/28</u>**







# SHRAMA VASANA FUND
# FINAL ACOUNTS 2016

## Description


1. Statement of Financial Position 02
2. Statement of Financial Performance 03
3. Statement of Changes in Funds 04
4. Cash Flow Statement 05
5. Statement of Accounting Policies 06
6. Notes to the Financial Statements 07-10
7. Fixed Deposit Analysis 11
8. Comparison of Budget 12
9. Trial Balance 13-14
10. Balance Confirmation letters

**Shrama Vasana Fund**
**Statement of Financial Position**
**as at December 31st ,2016**

| | | Rs. 2016 | Rs. 2015 |
|---|---|---|---|
| **Assets** | | | |
| **Current Assets** | | | |
| Cash and Cash Equivalents | | 5,356,725.69 | 917,326.57 |
| Inventories | **Note 04** | 2,079,533.16 | - |
| Deposit in Postal Machine | | 10,280.00 | 23,280.00 |
| Pre-payment Insuarance | | 201,705.98 | 142,198.97 |
| Receivables | **Note 03** | 326,496,635.50 | 333,997,625.66 |
| | | 334,144,880.33 | 335,080,431.20 |
| **Non-Current Assets** | | | |
| Investment in Fixed Deposit | | 52,000,000.00 | 35,000,000.00 |
| Investment in ISO & Web Base System | | 845,629.00 | 144,600.00 |
| Intangible asset | **Note 02** | 33,000.00 | 33,000.00 |
| Plant Machinary & Equipment | **Note 01** | 12,487,765.70 | 3,233,314.59 |
| | | 65,366,394.70 | 38,410,914.59 |
| Total Assets | | 399,511,275.03 | 373,491,345.79 |
| **Liabilities** | | | |
| **Current Liabilities** | | | |
| Payables | **Note 06** | 1,307,231.54 | 3,551,416.57 |
| Total liabitilies | | 1,307,231.54 | 3,551,416.57 |
| Net Assets | | 398,204,043.49 | 369,939,929.22 |
| **Accumulated Surpuls** | **Note 05** | 398,204,043.49 | 369,939,929.22 |
| Total net Assets | | 398,204,043.49 | 369,939,929.22 |

The Board of Directors of an entity is responsible for the preparation and presentation of its Financial Statements

| | | | |
|---|---|---|---|
| S.M.Gotabaya Jayarathne | M.D.C.Amarathunga | D.R.Jayalath | M.L.J.Fernando |
| Chairman | Director | General Manager | Accountant |
| ShramaVasana Fund | ShramaVasana Fund | ShramaVasana Fund | ShramaVasana Fund |

S.M. Gotabaya Jayarathne
Secretary
...of Labour and Trade Union Relations

එම්. ඩී. චාන්දනී අමරතුංග
කම්කරු කොමසාරිස් ජනරාල්
කම්කරු දෙපාර්තමේන්තුව

Mr. D. R. Jayalath
General Manager

M. L. J. Fernando
Accountant

**Shrama Vasana Fund**
**Statement of Financial Performance**
**as at December 31st ,2016**

| | | Rs. 2016 | Rs. 2015 |
|---|---|---|---|
| **Revenue** | | | |
| Income | **Note 08** | 68,509,170.45 | 65,398,341.79 |
| **Total Revenue** | | 68,509,170.45 | 65,398,341.79 |
| **Expenses** | | | |
| Administration Expences | **Note 09** | 8,952,149.91 | 7,109,721.84 |
| Depreciation | **Note 10** | 1,025,245.84 | 965,527.22 |
| Expenditure for objective of fund | **Note 11** | 30,267,660.43 | 18,829,460.31 |
| | | 40,245,056.18 | 26,904,709.37 |
| Surplus for Year | | 28,264,114.27 | 38,493,632.42 |

**Shrama Vasana Fund**
**Statement of Changes in Funds**
**For the Year Ended December 31, 2016**

| | Accumulated Fund | Total |
|---|---|---|
| **Balance as at 31st December 2014** | 331,446,296.80 | 331,446,296.80 |
| Surplus for the year | 38,493,632.42 | 38,493,632.42 |
| **Balance as at 31st December 2015** | 369,939,929.22 | 369,939,929.22 |
| Surplus for the year | 28,264,114.27 | 28,264,114.27 |
| **Balance as at 31st December 2016** | **398,204,043.49** | **398,204,043.49** |

**Shrama Vasana Fund**
**Cash flow Statement**
**For the Year Ended December 31, 2016**

| | | Rs. 2016 | Rs. 2015 |
|---|---|---|---|
| **CASH FLOWS FROM OPERATING ACTIVITIES** | | | |
| Surplus for year | *Note 11* | 28,264,114.27 | 38,493,632.42 |
| **Non-cash movements** | | | |
| Depreciation | | 1,025,245.84 | 965,527.22 |
| Increment of other payables | | (2,244,185.03) | 518,047.70 |
| Investment Interest | | (3,113,002.82) | (2,624,822.50) |
| Distress Loan Interest | | (16,739.80) | (9,172.22) |
| Repo investment interest | | (150,164.37) | - |
| Other income | | (127,933.46) | (155,207.07) |
| (Increase)/Decrease of other receivables | | 7,998,545.01 | **(43,014,170.00)** |
| (Increase)/Decrease in Inventories | | (2,079,533.16) | - |
| Net cash flows from operating activities | | 29,556,346.48 | **(5,826,164.45)** |
| | | | |
| **CASH FLOWS FROM INVESTING ACTIVITIES** | | | |
| Purchasing of Plant,Machinary & equipment | | (10,279,696.95) | (407,369.05) |
| Investment Interest | | 2,615,447.97 | 3,463,754.00 |
| Distress Loan Interest | | 16,739.80 | 9,172.22 |
| Repo investment interest | | 150,164.37 | - |
| Other income | | 127,933.46 | 155,207.07 |
| Deposit Postal Machine & Insurance | | (46,507.01) | (165,478.97) |
| Web Base & ISO | | (701,029.00) | (144,600.00) |
| Investment | | (17,000,000.00) | 2,000,000.00 |
| Net cash flows from investing activities | | (25,116,947.36) | 4,910,685.27 |
| | | | |
| Net increase/(decrease)in cash and cash equivalents | | 4,439,399.12 | (915,479.18) |
| Cash and cash Equivalants at beginning of period | | 917,326.57 | 1,832,805.75 |
| Cash and cash Equivalants at end of period | | 5,356,725.69 | 917,326.57 |

**SHRAMA VASANA FUND**
**Statement of Accounting Policies**

**1. Significant Accounting Policies**

**1.1 General Policies**

**1.1.1 Reporting Entity**

SHRAMA VASANA FUND is incorporated by Shrama Vasana Fund Act, No.12 Of 1998.

**1.1.2 Date of Authorization for issue**
The Financial Statements were authorized for issue by the Board of Directors on 16th February 2017.

**1.1.4 Basis of Preparation**

**a) Statement of Compliance**

The financial statement comply with Sri Lanka Public Sector Accounting Standards for the accrual basis of Accounting.

**b) Basic of Measurement**
The Financial statements have been prepared on historical cost basis adjusted for revaluations of assets.

**c) Use of Estimates and Judgements**
The financial statements have been prepared on a going concern basis and the accounting policies have been applied consistently throughout the period.

**Note 01**
**Plant machinary & Equipment**
**01-1**

| Cost | Restated balance as at 01.01.2016 | Additions | Disposal/write off | Balance as at 31.12.2016 |
|---|---|---|---|---|
| Vechicle | - | 9,125,000.00 | | 9,125,000.00 |
| Machinary & Equipment | 701,187.50 | 117,993.95 | 96,187.50 | 722,993.95 |
| Audio & Video Visual | 319,814.00 | 364,781.00 | - | 684,595.00 |
| Air Conditioners | 1,377,009.99 | - | | 1,377,009.99 |
| Computers | 1,780,504.00 | 517,000.00 | 163,750.00 | 2,133,754.00 |
| Furniture and Fittings | 1,275,199.80 | 110,932.00 | 29,855.00 | 1,356,276.80 |
| Office Equipment | 389,013.14 | 43,990.00 | 117,357.57 | 315,645.57 |
| | 5,842,728.43 | 10,279,696.95 | 407,150.07 | 15,715,275.31 |

**01-02**

| Depreciation | Restated balance as at 01.01.2016 | Charge for the period | Disposal/write off | Balance as at 31.12.2016 |
|---|---|---|---|---|
| Machinary & Equipment | 385,142.01 | 93,043.30 | 96,187.50 | 381,997.81 |
| Audio & Video Visual | 120,342.82 | 92,592.80 | | 212,935.62 |
| Air Conditioners | 584,134.70 | 257,045.49 | - | 841,180.19 |
| Computers | 1,110,464.22 | 431,584.25 | 163,750.00 | 1,378,298.47 |
| Furniture and Fittings | 197,612.77 | 128,581.21 | 29,855.00 | 296,338.98 |
| Office Equipment | 211,717.32 | 22,398.79 | 117,357.57 | 116,758.54 |
| | 2,609,413.84 | 1,025,245.84 | 407,150.07 | 3,227,509.61 |

**Note 02**
**Intangible Asset**

| | |
|---|---|
| Accounting Package | 33,000.00 |
| | 33,000.00 |

**Note 03**
**Other Receivables**

| | |
|---|---|
| Treasary Operation Department | 324,079,521.00 |
| Festival Advance | 13,000.00 |
| Distress Loan | 353,850.00 |
| Intrest on Fixed Deposit Investment | 2,034,979.51 |
| Other Receivable | 15,284.99 |
| | 326,496,635.50 |

**Note 04**
**Inventories**

| | |
|---|---|
| Stationary | 241,272.49 |
| Empower items | 5,305.00 |
| Awarnes mask | 3,520.00 |
| Welfare stationary | 1,575,194.42 |
| Promotion items | 254,241.25 |
| | 2,079,533.16 |

**Note 05**

| | |
|---|---|
| Cumulative Fund as at 01.01.2016 | 369,939,929.22 |
| Surplus for the year 2016 | 28,264,114.27 |
| Cumulative Fund as at 31.12.2016 | 398,204,043.49 |

**Note 06**

**Other payable**

| | |
|---|---|
| Welfare Programe | 8,675.00 |
| Provision For Audit Fee | 115,260.00 |
| Telephone Payable | 28,122.71 |
| Provision for Legal Aid | 250,000.00 |
| Advertising & Promotion Payable | 506,850.00 |
| water & electricity | 5,841.43 |
| Statonries Payable | 47,760.00 |
| Other Payable | 20,460.00 |
| Over Time | 15,262.40 |
| Award ceromony pro.Payable | 300,000.00 |
| Retantion 5% | 9,000.00 |
| | 1,307,231.54 |

**Note 07**

***Fixed Assets has been depreciated on Straight line basis***
***Following Rates are used.***

| | |
|---|---|
| Vehicle | 10% |
| Machinary & Equipment | 10% |
| Air Conditioners | 20% |
| Audio & Video Visual | 25% |
| Computers | 25% |
| Furniture and Fittings | 10% |
| Office Equipment | 7.5% |

***Depreciable value of final assets have been depreciated up to scrap value Rs.1***

**Note 08**

**Income**

| | |
|---|---|
| Shrama vasana Lottery Income | 65,101,330.00 |
| Fixed Deposit Investment Income | 3,113,002.82 |
| Distress Loan Interest Income | 16,739.80 |
| Repo Investment Income | 150,164.37 |
| Other Income | 127,933.46 |
| | 68,509,170.45 |

**Note 09**

**Administrative Expenditure**

| | |
|---|---|
| Salary & wages | 3,333,135.52 |
| E.P.F. | 526,839.40 |
| E.T.F. | 79,025.91 |
| Cost of Living Allowance | 865,800.00 |
| Other Allowance | 344,582.91 |
| Budgetery Allowance | 340,000.00 |
| Chairman Allowance | 120,000.00 |
| Practical trainee Allowance | 510,710.00 |
| Director board Allowance | 231,500.00 |
| Bonus | 142,335.00 |
| Overtime & Holiday pay | 268,386.42 |
| Domestic Travelling & Sub | 90,112.00 |
| Transport Charges | 228,106.00 |
| Stationery & Others | 258,674.51 |
| Postal Expenses | 15,685.00 |
| Telephone Expenses | 248,187.97 |
| Entertainment Expenses | 40,920.00 |
| Refreshment & Other | 227,466.71 |
| Sundry | 41,720.20 |
| Others | 12,076.54 |
| Audit Expenses | 49,038.00 |
| Staff training | 214,500.00 |
| Water & Electricity | 94,086.93 |
| Other Service | 275,597.35 |
| Maintance & Repair expence | 229,964.77 |
| Staff Welfare | 163,698.77 |
| | **8,952,149.91** |

**Note 10**

***Depreciation***

| | |
|---|---|
| Depreciation on Computers | 431,584.25 |
| Depreciation on Air Conditioners | 257,045.49 |
| Depreciation on Audio & Video Visual | 92,592.80 |
| Depreciation on Furniture and Fittings | 128,581.21 |
| Depreciation on Office Equipment | 22,398.79 |
| Depreciation on Machinary & Equipment | 93,043.30 |
| | 1,025,245.84 |

**Note 11**

**Expenditure to achive targets of the fund**

| | |
|---|---|
| Health camp Programme | 3,221,863.83 |
| Empowerment programme | 1,947,474.00 |
| Awarness Programme | 492,277.00 |
| Welfare programme | 9,545,555.16 |
| Technical education programme | 20,100.00 |
| Medical Assistance Programme | 40,000.00 |
| Legal Aid Programme | 381,875.00 |
| Scholarship programme | 5,619,094.84 |
| Miscellaneous | 2,195,481.00 |
| Award Ceremony Programme | 1,095,839.00 |
| Promotion Programme | 1,943,080.75 |
| Advertising Programme | 3,765,019.85 |
| | 30,267,660.43 |

***Note 11***

| | |
|---|---|
| *Surplus for year 2016* | *28,264,114.27* |
| *Surplus for year 2016 (Cash Flow)* | *28,264,114.27* |

**Shrama Vasana Fund**
**Comparison of Budget 2016**
**For the year December 31,2016**

| | Actual Amount | Budget Amount |
|---|---|---|
| **Administrative Expenditure** | | |
| *Salary & wages* | 3,333,135.52 | |
| *E.P.F.* | 526,839.40 | |
| *E.T.F.* | 79,025.91 | 4,840,000.00 |
| *Cost of Living Allowance* | 865,800.00 | |
| *Other Allowance* | 344,582.91 | |
| *Budgetery Allowance* | 340,000.00 | |
| *Chairman Allowance* | 120,000.00 | |
| *Practical trainee Allowance* | 510,710.00 | |
| *Director board Allowance* | 231,500.00 | |
| Bonus | 142,335.00 | 3,025,000.00 |
| *Overtime & Holiday pay* | 268,386.42 | 281,500.00 |
| *Maintance & Repair expence* | 229,964.77 | 312,700.00 |
| *Postal & Communication* | 263,872.97 | 275,000.00 |
| *Water & Electricity* | 94,086.93 | 1,100,000.00 |
| *Transport Charges* | 228,106.00 | 255,000.00 |
| *Other Service* | 324,635.35 | 375,000.00 |
| *Others* | 322,183.45 | 342,000.00 |
| *Staff Welfare* | 163,698.77 | 300,000.00 |
| *Domestic Travelling & Sub* | 90,112.00 | 110,500.00 |
| *Stationery & Others* | 258,674.51 | 605,000.00 |
| *Staff training* | 214,500.00 | 544,500.00 |
| | **8,952,149.91** | **12,366,200.00** |
| **Expenditure to achive targets of the fund** | | |
| Promote the welfare of employees | | |
| Health camp Programme | 3,221,863.83 | 4,700,000.00 |
| Empowerment programme | 1,947,474.00 | 3,000,000.00 |
| Awarness Programme | 492,277.00 | 500,000.00 |
| Welfare programme | 9,545,555.16 | 11,600,000.00 |
| Technical education programme | 20,100.00 | 250,000.00 |
| Medical Assistance Programme | 40,000.00 | 800,000.00 |
| Legal Aid Programme | 381,875.00 | 400,000.00 |
| Scholarship programme | 5,619,094.84 | 7,500,000.00 |
| Miscellaneous | 2,195,481.00 | 3,000,000.00 |
| Award Ceremony Programme | 1,095,839.00 | 2,750,000.00 |
| Promotion Programme | 1,943,080.75 | 2,300,000.00 |
| Advertising Programme | 3,765,019.85 | 4,900,000.00 |
| | 30,267,660.43 | 41,700,000.00 |
| **Plant machinary & Equipment** | | |
| Vechicle | 9,125,000.00 | |
| Machinary & Equipment | 117,993.95 | |
| Audio & Video Visual | 364,781.00 | |
| Computers | 517,000.00 | |
| Furniture and Fittings | 110,932.00 | |
| Office Equipment | 43,990.00 | 10,457,271.96 |
| | 10,279,696.95 | 10,457,271.96 |

**Shrama Vasana Fund**
**As at December 2016**
**Trail Balance**

| | | Dr. | Cr. |
|---|---|---|---|
| Bank | | 5,356,725.69 | |
| Fixed Deposit Investment | | 52,000,000.00 | |
| Inventories- | | | |
| | Stationary | 241,272.49 | |
| | Empower items | 5,305.00 | |
| | Awarnes mask | 3,520.00 | |
| | Welfare stationary | 1,575,194.42 | |
| | Promotion items | 254,241.25 | |
| Deposit Insuarance | | 201,705.98 | |
| Investment of ISO Certificate | | 372,529.00 | |
| Investment of Web base system | | 473,100.00 | |
| Deposit postal Machine | | 10,280.00 | |
| Other Receivable | | 15,284.99 | |
| T.O.D.Receivable | | 324,079,521.00 | |
| Fixed Deposit Interest receivable | | 2,034,979.51 | |
| Distress Loan | | 353,850.00 | |
| Festival Advance | | 13,000.00 | |
| Vehicle | | 9,125,000.00 | |
| Furniture & Fittings | | 1,356,276.80 | |
| Intangible asset-Accounting package | | 33,000.00 | |
| Audio & Video Visual | | 684,595.00 | |
| Machinary & Equipments | | 722,993.95 | |
| Airconditioners | | 1,377,009.99 | |
| Computers | | 2,133,754.00 | |
| Office Equipment | | 315,645.57 | |
| Accumulated Depreciation | | | |
| | -Office Equipment | | 116,758.54 |
| | -Computers | | 1,378,298.47 |
| | -Airconditioners | | 841,180.19 |
| | -Machinary & Equipments | | 381,997.81 |
| | -Audio & Video Visual | | 212,935.62 |
| | -Furniture & Fittings | | 296,338.98 |
| Award ceromony pro.Payable | | | 300,000.00 |
| Welfare Payable | | | 8,675.00 |
| Stationaries Payable | | | 47,760.00 |
| Advertising & Promotion Payable | | | 506,850.00 |
| Other Payable | | | 20,460.00 |
| Water & Electricity Payable | | | 5,841.43 |
| Audit Fee Payable | | | 115,260.00 |
| Overtime Payable | | | 15,262.40 |
| Telephone Payable | | | 28,122.71 |
| Legal aid Payable | | | 250,000.00 |
| Retaintion 5% | | | 9,000.00 |
| Cummulated Fund | | | 369,939,929.22 |
| Shrama Vasana Lotary | | | 65,101,330.00 |
| Depreciation-Office Equipment | | 22,398.79 | |
| | -Computers | 431,584.25 | |
| | -Airconditioners | 257,045.49 | |
| | -Machinary & Equipments | 93,043.30 | |
| | -Audio & Video Visual | 92,592.80 | |
| | -Furniture & Fittings | 128,581.21 | |

| | | |
|---|---|---|
| Assets Maintance & Repair | 127,561.91 | |
| Bank Charges | 2,399.04 | |
| Audit fee | 49,038.00 | |
| Telephone Charges | 248,187.97 | |
| Postage | 15,685.00 | |
| Water & Electricity Charges | 94,086.93 | |
| Office Maintance & Repair | 24,217.58 | |
| Transport | 228,106.00 | |
| Other Service | 275,597.35 | |
| Vehicle Maintance & Repair | 78,185.28 | |
| Practical Trainee Allowance | 510,710.00 | |
| Allowance for Directors | 231,500.00 | |
| Allowance for Chairman | 120,000.00 | |
| Budgetery Allowance | 340,000.00 | |
| Staff Salaries | 3,333,135.52 | |
| E.P.F. | 526,839.40 | |
| E.T.F. | 79,025.91 | |
| Cost of Living Allowance | 865,800.00 | |
| Bonus | 142,335.00 | |
| Other Allowance | 344,582.91 | |
| Staff welfare | 163,698.77 | |
| Overtime | 268,386.42 | |
| others | 9,677.50 | |
| Sundry Expence | 41,720.20 | |
| Refreshment & Other | 227,466.71 | |
| Entertainment | 40,920.00 | |
| Stationaries | 499,947.00 | |
| Stationory Purchase | | 241,272.49 |
| Domestic Travelling & Sub | 90,112.00 | |
| Health camp Expences | 3,221,863.83 | |
| Empowerment Expence | 1,952,779.00 | |
| Empowerment Purchase | | 5,305.00 |
| Worker Awareness | 495,797.00 | |
| Awareness items Purchase | | 3,520.00 |
| Welfare Programe Expence | 11,120,749.58 | |
| Welfare Stationory Purchase | | 1,575,194.42 |
| Medical Assistant Programme | 40,000.00 | |
| Techinical Education Programe Expence | 20,100.00 | |
| Legal aid Pograme Expence | 381,875.00 | |
| Scholership Programe Expence | 5,619,094.84 | |
| Micellaneous | 2,195,481.00 | |
| Advertising & Promotion Expence | 5,962,341.85 | |
| Promotion items Purchase | | 254,241.25 |
| Award Ceremony | 1,095,839.00 | |
| Training of Staff | 214,500.00 | |
| Other Income | | 127,933.46 |
| Interest of Diss.Loan | | 16,739.80 |
| Repo Investment Interest | | 150,164.37 |
| Fixed Deposit Interest Income | | 3,113,002.82 |
| | 445,063,373.98 | 445,063,373.98 |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } එල්ඊඩබ්/ඒ/එස්ඩබ්එෆ්/එෆ්ඒ /2016

මබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2017 සැප්තැම්බර් 20 දින.

සභාපති,

ශ්‍රම වාසනා අරමුදල.

**ශ්‍රම වාසනා අරමුදලේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

එච්.එම්. ගාමිණී විජේසිංහ

විගණකාධිපති.

පිටපත්:-

1. ලේකම් - කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය.
2. ලේකම් - මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය.

**විගණකාධිපති දෙපාර්තමේන්තුව**
**கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்**
**AUDITOR GENERAL'S DEPARTMENT**

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | එල්ඊඩබ්/ඒ/එස්ව්එෆ්/<br>එෆ්ඒ /2016 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2017 සැප්තැම්බර් 20 දින. |

සභාපති,

ශ්‍රම වාසනා අරමුදල.

**ශ්‍රම වාසනා අරමුදලේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

ශ්‍රම වාසනා අරමුදලේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, අරමුදල් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1998 අංක 12 දරන ශ්‍රම වාසනා අරමුදල පනතේ 12(4) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අරමුදලේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් අරමුදලේ සභාපති වෙත 2017 ජුනි 13 දින නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය නිරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උප වගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

--------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 වන දිනට ශ්‍රම වාසනා අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

--------------------------------------

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

--------------------------------------

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 09 හි 47 ඡේදය ප්‍රකාරව 2016 දෙසැම්බර් 31 දිනට පැවති තොගය මැනීමේදී යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

#### 2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

---------------------------------

සමාලෝචිත වර්ෂයේදී රු. 2,422,800 ක් වටිනා ඇස්කණ්නාඩි 2692 ක් බෙදා දී තිබුණ ද, ඒවා බෙදාදීම පිළිබඳ තහවුරු කරගැනීමේ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවිය.

#### 2.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 වර්ෂයේ සිට පැවත එන ගෙවිය යුතු රු. 140,000 ක නීති ආධාර මුදල් 2016 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ජාතික ලොතරැයි මණ්ඩලය මගින් ශ්‍රම වාසනා ලොතරැයි අලෙවි කිරීම වෙනුවෙන් පනතේ 13(3) වගන්තිය ප්‍රකාරව ඒකාබද්ධ අරමුදලට බැර කර තිබූ රු. 324,079,521 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු

ලෙස දක්වා තිබුණි. කෙසේ නමුත් මෙම මුදල් භාණ්ඩාගාරයෙන් ලබාදීමේදී අරමුදලේ ආදායම්, වියදම් ඇස්තමේන්තු හා කාර්යසාධන ප්‍රගතිය සමාලෝචනය කරමින් එම මුදල් නිදහස් කරන බැවින් එම සම්පූර්ණ මුදලම ලැබීම අවිනිශ්චිත තත්ත්වයක පැවතුණි.

## 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකුල නොවීම්.

පහත සඳහන් නීති රීති හා රෙගුලාසිවලට අනුකුල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකුල නොවීම් |
|---|---|
| (අ) 1998 අංක 12 දරන ශ්‍රම වාසනා අරමුදල් පනත | |
| (i) 6 (අ) වන වගන්තිය | ප්‍රතිලාභ හිමි විය යුතු සේවානියුක්තිකයන් හඳුනාගැනීමට විධිමත් ක්‍රමවේදයක් කළමනාකරණය විසින් සකස් කර නොතිබුණි. |
| (ii) 13(1), 13(2) හා 13(3) වගන්ති | එක් එක් වර්ෂයේ දී පවත්වනු ලැබිය යුතු ලොතරැයි සංඛ්‍යාව හා ලොතරැයි වර්ග, ප්‍රදානය කෙරෙන තෑගි පිළිබඳව සහ හිමිකම් නොපෑ තෑගි සම්බන්ධයෙන් කටයුතු කෙරෙන ආකාරය හා ලොතරැයි වලින් ලැබෙන මුදල්, ප්‍රදානය කරනු ලබන තෑගි වල වටිනාකම හා ලොතරැයිය පැවැත්වීමේ වියදම් සම්බන්ධයෙන් ලොතරැයි මණ්ඩලය හා අරමුදල අතර එකඟතාවයන් ඇති කරගෙන නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 272 (1) හා (2) | වාහන අළුත්වැඩියා සඳහා ගෙවන ලද රු. 341,940 ක වියදමක් සම්බන්ධ වවුචරයක් අරමුදලේ අභ්‍යන්තර පාලන ක්‍රමයේ පවතින දුර්වලතා හේතුවෙන් අස්ථාන ගත වී තිබුණද ඒ සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

---

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 28,264,114 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 38,493,632 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 10,229,518 කින් පිරිහී තිබුණි. අරමුදලේ අරමුණු සඳහා වන වියදම් රු.11,438,200 කින් හා පරිපාලන වියදම් රු. 1,842,428 කින් ඉහළ යාම ඉහත පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේදී රු.47,201,339 ක් වූ අරමුදලේ අතිරික්තය 2016 වර්ෂය වන විට රු. 28,264,114 ක් දක්වා අඛණ්ඩව පිරිහී තිබුණි. කෙසේ නමුත් මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වන ක්ෂය නැවත ගැලපීමේදී අරමුදලේ දායකත්වය 2012 වර්ෂයේදී රු.48,677,411 ක් වූ අතර එය 2013 වර්ෂයේදී රු. 59,390,283 දක්වා වර්ධනය වී තිබුණද 2014 වර්ෂයේ සිට දායකත්වය අඛණ්ඩව පහත වැටී සමාලෝචිත වර්ෂයේදී එය රු. 33,488,296 ක් වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

---

ලොතරැයි ආදායම වැඩිකර ගැනීම හා පනතේ අරමුණු පිළිබඳ සේවා නියුක්තිකයන් දැනුවත් කිරීම සඳහා ප්‍රවර්ධන හා ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් දරා තිබූ වියදම් 2015 වර්ෂයේදී සියයට 641 කින්ද සමාලෝචිත වර්ෂයේදී සියයට 310 කින්ද වර්ධනය වී තිබුණි. එහෙත් ඊට සාපේක්ෂව ලොතරැයි ආදායමේ වර්ධනය 2015 වර්ෂයේ දී සියයට 4.54 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේදී එය සියයට 3.98 දක්වා අඩු වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

1998 අංක 12 දරන ශ්‍රම වාසනා අරමුදල් පනත ප්‍රකාරව අරමුදලේ ප්‍රධාන අරමුණු පහත පරිදි විය.

* සේවා නියුක්තිකයන්ගේ සුභසාධනය ප්‍රවර්ධනය කිරීම හා හදිසි අවස්ථාවලදී සේවා නියුක්තිකයන්ට වෛද්‍ය හා වෙනත් පහසුකම් සැපයීම.

* සේවා නියුක්තිකයන් සේවයෙහි යෙදී සිටි ආයතන පූර්ව දැනුම්දීමකින් තොරව වසා දැමූ අවස්ථාවක. ඒ සේවා නියුක්තිකයන්ට මූල්‍ය හා වෙනත් ආධාර සැපයීම.

* සේවා නියුක්තිකයන්ට විරුද්ධව පරීක්ෂණ ආරම්භ කරනු ලැබූ විටකදී ඔවුන්ට තාවකාලික ආධාර සැපයීම.

* ව්‍යසන අවස්ථා වලදී සේවා නියුක්තිකයන්ට හෝ ඔවුන්ගෙන් යැපෙන්නන්ට මූල්‍යමය සහ වෙනත් ප්‍රතිලාභ සැපයීම.

* සේවා නියුක්තිකයන්ගේ සුභසාධනය සඳහා විශිෂ්ට සේවයක් කර ඇති තැනැත්තන්ට ත්‍යාග පිරිනැමීම.

ඉහත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රගති වාර්තාවන් පරීක්ෂා කිරීමේදී අනාවරණය වූ කරුණු පහත පරිදි වේ.

(අ) 2016 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව රු. මිලියන 3.2 ක් වැයකර ඉටුකර ගැනීමට අපේක්ෂා කළ කෘතිම අත්පා බෙදාදීම හා වන්දි ප්‍රතිලාභ වැඩසටහන් 02 ක් සමාලෝචිත වර්ෂය තුළදී ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කර නිම කළ යුතුව තිබූ වැඩසටහන් 09 ක් අතුරින් වැඩසටහන් 03 ක ප්‍රගතිය සියයට 02 සිට සියයට 10 දක්වා අඩු මට්ටමක පැවති අතර වැඩසටහන් 03 ක ප්‍රගතිය සියයට 50 සිට සියයට 70 අතර පැවතුණි.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

---

නිවැරදි ප්‍රසම්පාදන ක්‍රියාවලියක් අනුගමනය කර කොන්ත්‍රාත්කරුවෙකු තෝරාගෙන තිබුණේද යන්න තහවුරු කර ගැනීමකින් තොරව හා ඉදිකිරීම් සඳහා සකස් කළ ඇස්තමේන්තුවක් ලබානොගෙන අරමුදලේ කළමනාකාරීත්වය විසින් රු.600,000 ක මුදලක් දැල්පන්දු පිටියක් සැකසීම සඳහා කටුනායක ආයෝජන ප්‍රවර්ධන කලාපයට ලබා දී තිබුණි.

4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

---

වැඩ බිමේදී හදිසි අනතුරකට මුහුණදී පාදයක් හෝ අතක් අහිමිවූ අය සඳහා කෘතිම පාදයක් හෝ අතක් ලබාදීම සඳහා " වැඩ බිමේදී ආබාධිත වූ ඔබගේ ශ්‍රමයට සවියක් " යන තේමාව යටතේ 2016 වර්ෂය තුළ දී වැඩසටහනක් පැවැත්වීම සඳහා දැන්වීම් පලකිරීමට පමණක් රු. 612,798 ක් වැයකර තිබුණද 2017 මාර්තු 30 දින වන විටත් එම වැඩසටහන පවත්වා නොතිබුණි.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

---

5.1 අභ්‍යන්තර විගණනය

---

අරමුදල සඳහා අනුමත කාර්ය මණ්ඩලය තුළ අභ්‍යන්තර විගණන නිලධාරී තනතුර 2013 නොවැම්බර් 12 දින සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම පුරප්පාඩුව පැවතුණි. ඒ සඳහා නිලධාරියෙකු බඳවා ගෙන අභ්‍යන්තර විගණනය ශක්තිමත් කිරීමට කළමනාකාරීත්වයේ අවධානය යොමුවී නොතිබුණි.

6. පද්ධති හා පාලනයන්

---

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අරමුදලේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) අයවැය ලේඛනමය පාලනය | අයවැයගත සංඛ්‍යා සහ තථ්‍ය සංඛ්‍යා අතර පවතින විචලතාවයන් අඩුකර අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස භාවිතා කර නොතිබීම. |
| (ආ) මෙහෙයුම් පාලනය | අරමුදල විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ව අනුමැතිය ලබාගැනීමෙන් තොරව වැඩසටහන් පැවැත්වීම. |
| (ඇ) ගිණුම්කරණය | ගනුදෙනු ගිණුම්ගත කිරීමේදී මූලාශ්‍ර ලියවිලි භාවිතා කර නොතිබීම. |
| (ඈ) තොග පාලනය | ආයතනයේ මිලදී ගැනීම් තොග ලේඛන වල සටහන් නොකිරීම හා එම ලේඛන යාවත්කාලීන නොකිරීම. |

එච්.එම් ගාමිණී විජේසිංහ
විගණකාධිපති.